# පුවත් පත් නිවේදනයයි

## 2011 වර්ෂය තුල රක්ෂණ කර්මාන්තයේ සිදු වූ ප්‍රගතිය

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, විචක්ෂණශීලී නියාමන ආයතනයක් ලෙස ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය වෙනුවෙන් නිසි මග පෙන්වීමක් කරනු ලබයි. වර්ෂ 2000, අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ ආඥා පනත යටතේ පිහිටුවනු ලැබූ මණ්ඩලය නිසි අධීක්ෂණයක යෙදෙන නියාමන ආයතනයක් ලෙස, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරයේ ගෞරවය හා රක්ෂණ ඔප්පු හිමියන් හා අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව සුරැකෙන අයුරින් ක්‍රියාකරමින්ද, රක්ෂණ කර්මාන්තයේ දියුණුවට පහසුකම් සපයමින්ද කිහිප ආකාරයක වගකීම් දරනු ලබයි. 2010 වර්ෂය හා සසඳන කළ, 2011 වර්ෂයේදී රක්ෂණ කර්මාන්තය ඉහළ ප්‍රගතියක් අත්කර ගෙන තිබේ.

2011 වසර අවසාන වන විට රක්ෂණ සමාගම් 22ක් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇත. මෙයින් සමාගම් 12 ක් ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ යන ව්‍යාපාර දෙවර්ගයේම නියැලී සිටින අතර සමාගම් 07 ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පමණක් කරන අතර, සමාගම් 03 ජීවිත රක්ෂණ ව්‍යාපාර වල පමණක් කටයුතු කරයි. (සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් 2009 වර්ෂයේ සිට රක්ෂණ ව්‍යාපාරයේ නොයෙදේ.)

2011 වර්ෂය තුල ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල දළ ලිඛිත වාරික ආදායම (Overall Gross Written Premium/GWP) රු. මිලියන 78,512 වූ අතර එය 2010 වර්ෂය හා සැසඳීමේදී 18.50% වර්ධනයක් පෙන්වයි. 2010 වර්ෂයේ දළ ලිඛිත වාරික ආදායම වූයේ රු.මිලියන 66,253 කි. මෙය ජීවිත රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය ලෙස පහත දැක්වෙන ආකාරයට වෙන්වෙන්ව බැලීමේදී ද 2011 වර්ෂය තුළ ආදායම් වර්ධනයක් පෙන්වා ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල දළ ලිඛිත වාරික ආදායම රු.මිලියන 43,331කි. (එය 2010 දී රු.මිලියන 35,101කි) ජීවිත රක්ෂණ ව්‍යාපාර දළ ලිඛිත වාරික ආදායම රු.මිලියන 35,181 කි. (එය 2010 දී රු.මිලියන 31,152කි)

| වර්ෂය | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| ජීවිත රක්ෂණ ව්‍යාපාරය | 20,706 | 23,613 | 24,005 | 31,152 | 35,181 |
| සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය | 31,184 | 34,558 | 33,548 | 35,101 | 43,331 |
| **මුළු දළ ලිඛිත වාරික ආදායම** | **51,890** | **58,171** | **57,553** | **66,253** | **78,512** |

ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල දළ ලිඛිත වාරික ආදායම (රු. මිලියන)



*සටහන*

1. *දළ ලිඛිත වාරික මත පදනම් වූ ඉහත විශ්ලේෂණයේ 2011 වර්ෂයේ දත්ත විගනණයට පෙර ලබාගත් ඒවා වන අතර 2007, 2008, 2009 හා 2010 වර්ෂවල විගනණය කරන ලද දත්තයන් නැවත පුනස්ථාපනය කළ ඒවා වේ..*
2. *2010 හා 2011 වර්ෂවල ජාතික රක්ෂණ භාර අරමුදල විසින් උපයනු ලබන වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී විපත් අරමුදලේ වාරික ආදායම රක්ෂණ සමාගම්වල දළ ලිඛිත වාරික ආදායමට ඇතුළත් කර නැත.*
3. *ඉහත විස්තරය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ දත්ත ඇතුළත් කර නැත.*

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම් වල මුළු වත්කම් ප්‍රමාණය** 2011 **වර්ෂය තුල ඉහළ ගොස් ඇත. එය රු.මිලියන** 265,419**කි**. 2010 **වසර අවසානයේ මුළු වත්කම් ප්‍රමාණය රු.මිලියන** 221,888**කි**.

| **වර්ෂය** | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| **මුළු වත්කම් ප්‍රමාණය** (රු. මිලියන) | 134,876 | 155,994 | 181,045 | 221,888 | 265,419 |

**රක්ෂණ සමාගම් වල මුළු වත්කම් ප්‍රමාණය**




**රක්ෂණ සමාගම් වල වත්කම් වල යම් ප්‍රතිශතයක් රජයේ සුරැකුම් පත්වල** (Government Securities) **ආයෝජනය කිරීම නීතිමය අවශ්‍යතාවයකි. එනම් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල වත්කම් ඇතුලත් තාක්ෂණික සංචිතයේ** (Technical Reserve) **අරමුදලින්** 20% **රජයේ සුරැකුම් පත්වල ආයෝජනය කළ යුතුය. මේ අනුව පසුගිය වසර තුල** 24.87% **ක් රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කර ඇත** (**රු.මිලියන** 24,804**කි**). **ඒ හා සමානව ජීවිත රක්ෂණ අරමුදල් වලින්** 30% **රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කළ යුතු අතර**, **එය** 50.67% **ක් දක්වා ආයෝජනය කර තිබේ** (**රු.මිලියන** 83,944**කි**).

*සටහන*

1. *ඉහත විස්තරය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ දත්ත ඇතුළත් කර නැත.*
2. *ඉහත කී විස්තරයේ වත්කම්වල අන්තර් අංශ ගණුදෙනු (ජීවිත සහ සාමාන්‍ය) සළකා බලා නැත.*

2011 **වර්ෂය තුල රක්ෂණ තැරුව්කාර සමාගම්** 46 **ක් තිබූ අතර රක්ෂණ තැරුව්කාර සමාගම් විසින් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වලින් උපයන ලද දළ ලිඛිත වාරික ආදායම රු.මිලියන** 10,489**ක් වූ අතර එය** 2010 **වර්ෂයේ රු.මිලියන** 9,560**ක් විය. මෙය** 9.72% **ක වර්ධනයකි** (**එය** 2010 **දී** 7.58% **කි**).

| **වර්ෂය** | **2007** | **2008** | **2009** | **2010** | **2011** |
|---|---|---|---|---|---|
| **ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වලින් උපයන ලද දළ ලිඛිත වාරික ආදායම** (රු. මිලියන) | 7,551 | 8,976 | 8,886 | 9,560 | 10,489 |

**රක්ෂණ තැරුව්කාර සමාගම් විසින් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වලින් උපයන ලද දළ ලිඛිත වාරික ආදායම**




## ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

05.06.2012